විශ්‍රාම වැටුප් චක්‍රලේඛ : 01/2015 (සංශෝධන II)

මගේ අංකය - විවැ/චක්‍රලේඛ/2018,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10,
2018.06.26

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් ,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

**වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම**
**(අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම)**

ඉහත කරුණ සම්බන්ධව නිකුත් කරන ලද 2015.02.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2015 හා 2015.10.09 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2015 (සංශෝධන) හි උපදෙස් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. ඒ අනුව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2015 (සංශෝධන) හි වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම සඳහා අයදුම්කිරීමට ලබා දී තිබූ 1:1 හා 1:2 විධිවිධාන **2018.06.30** දින සිට අවලංගු කරනු ලැබේ.

03. විශ්‍රාම වැටුප් අයදුම්කිරීම සඳහා 2016.10.10 දින සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2015(සංශෝධන 11) න් උපදෙස් දී ඇති අතර එම කාර්යය තවදුරටත් දීර්ඝ කරමින් වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම සඳහා අයදුම්කිරීමද මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට කටයුතු සලසා ඇත. මේ සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.pensions.gov.lk හි PMS (Pension Management System) යොමුව ඔස්සේ හෝ http://sathkara.pensions.gov.lk/pms ඔස්සේ සම්බන්ධ විය හැකිය.

04. මෙම සේවාව යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමය යටතේ (Online PD 03) විශ්‍රාම වැටුප් අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් සඳහා පමණි.

05. මේ සඳහා ආයතනය විසින් භාවිත ගිණුම (User Account) හි පරිශීලක නාම (User Name) සහ මුරපද (Password) භාවිතා කර ඇතුළු විය හැකිය.

06. මෙම සේවාවට පිවිස අයදුම්පත ඉදිරිපත් කළයුතු ආකාරය සම්බන්ධ සම්පූර්ණ භාවිත උපදෙස් මාලාව සහ මාර්ගගත ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමේදී අදාල වන ආකෘති පත්‍ර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත පිවිස එහි මාර්ගෝපදේශ (Guidelines) යොමුව ඔස්සේ ලබා ගත හැකිය.

07. 2016.10.10 දිනෙන් පසුව විශ්‍රාම ගිය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ PD 03 අයදුම්පත් ඉදිරිපත් කරන ලද විශ්‍රාමිකයින්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු දායක මුදල් ආපසු ලබා ගැනීමට අදාල අයදුම්පත් අනිවාර්යයෙන්ම මෙම නව ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කල යුතු වේ. ඒ අනුව **2018.06.30 දිනෙන් පසු මීට පරිබාහිරව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** එහෙත් 2016.10.10 දිනට ප්‍රථම විශ්‍රාම ගිය විශ්‍රාමිකයින් දැනට පවතින ක්‍රමවේදය ඔස්සේම තම දායක මුදල් ආපසු ගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කල යුතු වේ.

08. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලබන නිලධාරීන්/ නිලධාරිනියන්ට සේවා අවසාන ප්‍රතිලාභ කඩිනමින් හිමිගැන්වීම සඳහා ඔබ විසින් දක්වන සහයෝගය පිළිබඳව කෘතඥ වෙමි.

09. මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන, කළමනාකරණ, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය මත නිකුත් කෙරේ.

ඒ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-
1. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ. සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ. සඳහා
3. ලේකම් - රාජ්‍ය පරිපාලන,කළමනාකරණ, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය - කරු. දැ.ගැ. සඳහා
4. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - කරු. දැ.ගැ. සඳහා
5. විගණකාධිපති - කරු. දැ.ගැ. සඳහා